News Bulletin

Lanka Microfinance Practitioners' Association

# ලංකා ක්‍ෂුද්‍රමූල්‍ය වෘත්තිකයන්ගේ සංගමය

LMFPA පුවත් ප්‍රකාශනය 2014 ජනවාරි

## ගරු සභාපතිතුමාගේ පණිවිඩය



ලැබුවාවූ 2014 නව වසර අපගේ ක්‍ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයේ යෙදී සිටින සියලු සාමාජිකයන්ට හා ස්වාර්ථලාභින්ට සාර්ථකත්වයෙන් පිරි ශ්‍රී සුභ නව වසරක් වේවායි ලංකා ක්‍ෂුද්‍ර මූල්‍ය වෘත්තිකයන්ගේ සංගමය වෙනුවෙන් මම ප්‍රාර්ථනා කරමි. ක්‍ෂුද්‍ර මූල්‍ය ක්‍ෂේත්‍රයේ නියාමන පද්ධතියක් අපේක්‍ෂා කළ බොහෝ දෙනාට පසුගිය වසර අභියෝගාත්මක එකක් විය. කෙසේ වෙතත් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ප්‍රමාදය අඩු ආදායම් ලාභින්ගේ ජීවන තත්වය නඟා සිටුවීමේ ක්‍රියදාමයට කිසිසේත් බාධාවක් නොවේ. අපගේ සාමාජික ආයතනයන්ට වඩාත් ඵලදායී සේවාවක් ලබාදීමට අප උනන්දු වන අතර ඒ සඳහා සාමාජිකයන්ගේ ප්‍රතිපෝෂණය අප බෙහෙවින් අගය කරන්නෙමු. ක්‍ෂුද්‍ර මූල්‍ය ක්‍ෂේත්‍රයට ආචාරධර්ම මාලවක් හඳුන්වා දීම, සාමාජික ආයතන වල ගිණුම් කාර්ය මණ්ඩලය සඳහා ජාත්‍යන්තර මූල්‍ය වාර්තා මට්ටම් පිළිබඳ වැඩසටහන්, ක්‍ෂුද්‍ර මූල්‍ය ගණුදෙණුකරුවන් සිතියම් ගත කිරීම හා ණය තොරතුරු පද්ධති පිළිබඳ නියාමක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි බොහෝ ක්‍රියාකාරකම් 2014 වර්ෂයේ සිදු කිරීමට අපි බලාපොරොත්තු වෙමු. ඒ සඳහා අපගේ ක්‍රියාකාරී සාමාජිකයන්ගේ වටිනා සහයෝගය LMFPA හි දියුණුවට මහත් පිටිවහලක් වනු නොඅනුමානයි.





## "පොහොසත් පවුල" පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

ජ්ලැන් ශ්‍රී ලංකා ආයතනයේ සහයෝගිතාවය මත LMFPA විසින් සංවිධානය කරන ලද "පොහොසත් පවුල" පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් දෙකක් කොළඹදී සාර්ථක ලෙස පැවැත්වීමෙන් අනතුරුව පසුගිය නොවැම්බර් හා දෙසැම්බර් මාසයන්හි රත්නපුර හා මාතර නගර වලදී පැවැත්විය. ආයතන 11 ක් නියෝජනය කරමින් සාමාජිකයින් 37 දෙනෙකු මේ සඳහා සහභාගි විය. 2013 මැයි හා සැප්තැම්බර් මාසයන්හිදී පැවැත්වූ පුහුණු වැඩසටහන් වලට සහභාගි වූවන්ගෙන් කිහිපදෙනෙක් මෙම වැඩසටහන සඳහා පුහුණුකරුවන් ලෙස දායක විය. වැඩසටහනට සහභාගි වූවන් සියලු දෙනාගේ යහපත් ප්‍රතිචාර LMFPA වෙත ලැබින.



News Bulletin




## සුළු මූල්‍යකරණයේදී සමාජයීය කාර්යභාරය හා පෝසත් පවුල වැඩසටහන අතර සම්බන්ධය කුමක්ද?

සුළු මූල්‍යකරණය නිවැරදිව එහි ඉලක්ක වලට අනුකූලව සිදු කිරීම සුළු මූල්‍ය කරණයේදී සමාජයීය කාර්යභාරය යැයි සරලව හැඳින්විය හැක. සුළුමූල්‍යකරණයෙහි ඉලක්ක තුනක් ඇත: දුප්පත් හා බැංකුවලින් සේවා ලබා ගත නොහැකි ප්‍රජාවන්ට ළඟා වීම, ඔවුනට ගැළපෙන සේවා ලබා දීම හා ඔවුන්ගේ ජීවිතවල සුභදායී වෙනසක් සිදු කිරීම යනු ඒවායි.

ජලැන් ශ්‍රී ලංකා ආයතනයේ පෝසත් පවුල වැඩසටහන මෙම ඉලක්ක තුනම මනාව ආමන්ත්‍රණය කරයි. එමඟින් ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් වලින් ඉලක්ක කළ යුතු ප්‍රජාව කවුරුන්ද යන්නත්, වැඩසටහන් වලින් ලබා දිය යුතු කුසලතා හා සේවා පිළිබඳවත්, ක්ෂුද්‍රමූල්‍ය ආයතන හැටියට අපට අපගේ සේවා ලාභින්ගේ ජිවිතවල හා පවුල් වල කළ හැකි වෙනස්කම් පිළිබඳවත් මනාව පහදා දෙයි.

සැබවින්ම ගෘහ ආර්ථිකය විවිධ කරුණු හා සාධක මත රඳා පවතී. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් මෙම සාධක පිළිබඳව වටහා නොගැනිම හා හඳුනා ගැනිම නොකළහොත් එය එම ආයතනයට විශාල අවධානමක් රැගෙන එන අතර සේවා ලාභියාගේ ජීවිතයද ඉමහත් අවධානමකට හා අනතුරකට හෙලයි (උදා: අධික ණය ගැතිභාවය). මෙය පසුගිය කාලයේදී අසන්නට ලැබුණු සමහර සිද්ධීන් මඟින් ඉස්මතු වී ඇත. ඉතාමත් භයානක තත්වය වන්නේ මේ සිද්ධීන් වල එකම හා ලොකුම වැරදිකාරයා වන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන යැයි කියා පෙන්වා දීමයි. "ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මිනිසුන්ගේ ජිවිත අනතුරේ හෙලයි" යන්න එමඟන් වඩ වඩාත් තහවුරු කිරීමට උත්සාහ දැරීමයි.

ජලැන් ශ්‍රී ලංකා ආයතනයේ පෝසත් පවුල වැඩසටහන උත්සාහ දරන්නේ සේවා ලාභින් සැබෑ බල ගැන්වීමකට පත් කිරීමටයි. විශේෂයෙන්ම කාන්තාවන් මෙන්ම පුරුෂයින් ද එක ලෙස බල ගැන්වීම අත්‍යවශ්‍ය වන්නේ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව ඔවුන් ආර්ථිකව අනාරක්ෂිතවීම හා මූල්‍ය වශයෙන් සාක්ෂරතාවයෙන් තොර වීමයි. බල ගැන්වුණු සේවා ලාභියා නිවැරදි මූල්‍ය තීරණ නිවැරදි වෙලාවේදී ගැනීමට වග බලා ගනී. අන් අයගේ බලපෑම වලට හසුවී වැරදි මූල්‍ය තීරණ නොගනී. එබැවින් ඔහු හෝ ඇය අධික ණය ගැතිභාවයට පත්වීම හෝ ඔවුන්ට තිබෙන සම්පත් එක තැන රැඳී අකර්මන්‍ය වීම සිදු නොවේ.

## LMFPA හි ගරු ලේකම් ඉස්ලාමීය ක්ෂුද්‍ර මූල්‍ය වෙනුවෙන් සම්මානයක් දිනා ගනියි.




ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය ක්ෂුද්‍ර මූල්‍ය වෙනුවෙන් සිදු කළ දායකත්වය ඇගයීම වෙනුවෙන් LMFPA හි ගරු ලේකම් ඉම්රාන් නාෆිර් මහතා වසරේ නැගී එන ඉස්ලාමීය මූල්‍ය පෞරුෂත්වය වෙනුවෙන් රන් සම්මානයක් දිනා ගන්නා ලදි. සම්මාන රාත්‍රිය 2013 ඔක්තෝම්බර් 23 වන දින ශ්‍රී ලංකා ඉස්ලාමීය බැංකු හා මූල්‍ය ආයතනය විසින් සංවිධානය කරන ලදි. ඉම්රාන් මහතාගේ ජයග්‍රහණය වෙනුවෙන් LMFPA ආයතනය සුභාශිංසන පුද කරමු.

## LMFPA හි නව සාමාජික ගාස්තු

| සාමාන්‍ය සාමාජික | |
|---|---|
| ණය කළඹ රුපියල් මිලියන 50 දක්වා වර්ෂයකට | රු. 5,000 |
| ණය කළඹ රුපියල් මිලියන 50 සිට රු. මිලියන 100 දක්වා | රු. 7,500 |
| ණය කළඹ රුපියල් මිලියන 100 සිට රු. මිලියන 200 දක්වා | රු. 10,000 |
| ණය කළඹ රුපියල් මිලියන 200 සිට රු. මිලියන 500 දක්වා | රු. 15,000 |
| ණය කළඹ රුපියල් මිලියන 500 සිට රු. බිලියන 1 දක්වා | රු. 20,000 |
| ණය කළඹ රුපියල් බිලියන 1 සිට ඉහළට | රු. 25,000 |

| ආශ්‍රිත සාමාජික | |
|---|---|
| ඒක පුද්ගල | රු. 5,000 |
| සංවිධායක සේවා සපයන්නන් | රු. 10,000 |
| බැංකු, මූල්‍ය ආයතන, මූල්‍ය අරමුදල් සපයන්නන් සහ සහභාධාර සපයන්නන්. | රු. 25,000 |

වැඩි විස්තර සඳහා කළමණාකරු අමතන්න.

*******************************

ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයන්ගේ සංගමය
112 A, මද්දුමගේවත්ත,
නුගේගොඩ.
දුක: +94 11 4367621, 4369612
ෆැක්ස්: +94 11 2827109
විද්‍යුත් තැපැල: info@lankamicrofinance.com
වෙබ් අඩවිය: www.microfinance.lk